රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2021.05.22**

**නිවේදන අංකය: 494 /2021**
**නිකුත් කළ වේලාව:1:15**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ**
**අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු**

2021.05.20 දින කොවිඩ් ආසාදිත රෝගීන්ගේ මරණ සංඛ්‍යාව 38ක් ලෙස වාර්තා කළ ද එය 37 ක් ලෙසට නිවැරදි විය යුතු බවත්, ඒ අනුව එදිනට (20) වාර්තා වී ඇති කොවිඩ් ආසාදිතයන්ගේ සමස්ත මරණ සංඛ්‍යාව 1088ක් බවත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සඳහන් කරයි.

**ඊයේ (21) කොවිඩ් මරණ 44 යි**

2021 මැයි 02 දින සිට මැයි 20 දක්වා සිදුව ඇති කොවිඩ් 19 ආසාදිත රෝගීන්ගේ මරණ 44 ක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් **ඊයේ (21)** තහවුරු කරන ලදී. ඒ සමග ශ්‍රී ලංකාවෙන් වාර්තා වන කොවිඩ් - 19 ආසාදිත රෝගීන්ගේ සමස්ත මරණ සංඛ්‍යාව 1132 කි.

මියගිය අය ඇටවීරගොල්ලෑව, හොරම්පැල්ල, අම්බලන්ගොඩ, කලල්ගොඩ, හිඳගල, බුලත්සිංහල, හොරණ, ගල්පාත, කුඩාවස්කඩුව, පිහිඹුව, අනුරාධපුරය, මන්නාරම, රත්ගම, ඉමදුව, මග්ගොන, මතුගම, වේයන්ගොඩ, අතුරුගිරිය, සෙවනගල, මල්ලෑව, කිරිමැටියාව, ඉහළ කටුනේරිය, මහනුවර, පරගස්තොට, උතුරු කළුතර, වලල්ලාවිට, බේරුවල, පයාගල, කොළඹ 12, කොළඹ 02, පොල්ගස්ඕවිට, ගාල්ල, නාක්කවත්ත, රාගම, පන්නිපිටිය, හෝමාගම, නාරංගොඩ, ගනේපොල, ගොකරැල්ල, අලහිටියාව, හිඳගොල්ල, බණ්ඩාරකොස්වත්ත යන ප්‍රදේශවල පදිංචිකරුවෝ වෙති.

ඔවුන්ගෙන් 23 දෙනෙක් වයස අවුරුදු 71 ඉක්මවූවෝ වෙති. වයස අවුරුදු 61 සහ 70 අතර 11 දෙනෙක් ද, වයස අවුරුදු 51 - 60 අතර 07 දෙනෙක් ද, වයස අවුරුදු 31-40 අතර දෙදෙනෙක්ද, වයස 21 - 30 ත් අතර එක් අයෙක් ද වෙති.

මොවුන්ගේ මරණ වලට මූලික හේතු වී ඇත්තේ කොවිඩ් නියුමෝනියාව සහ දියවැඩියාව, හෘද රෝග වැනි නිදන්ගත රෝග ආශ්‍රිත සංකූලතා බව සඳහන් වේ. මියගිය පිරිසෙන් 30ක් පිරිමි වන අතර ඉතිරි සියලු දෙනා කාන්තාවෝ වෙති.

**මොහාන් සමරනායක**
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை அவனியூ, கொழும்பு 05, இலங்கை.
(+94 11) 2515759
(+94 11) 2514753
www.news.lk